TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 5
2019.11.02

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ කාලසීමාව තුළ පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව ලංකා විදුලිබල මණ්ඩලය මගින් නිකුත් කළ ලිපියක, 2019.09.18 දින පැවැත්වූ විභාගයක ප්‍රතිඵල සහ 2019.10.28 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත "අර්ධ පුහුණු අභ්‍යාසලාභී පාරිභෝගික සම්බන්ධීකාරක" නමින් වූ තනතුරක් සඳහා පත්වීම් 2019.10.28 වන දින සිට ලබාදෙන බවට සඳහන් වී ඇති බව වාර්තා වී ඇත. එම සඳහන ඇතුලත් වූ ලිපියේ ඡායාරූප මේ සමග අමුණා ඇත. අප මෙම පත්වීම් ප්‍රදානය පිළිබඳ ත්‍රිකුණාමල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලයෙන් විමසීමක් කළ අතර ඔවුන්ව මෙම පත්වීම් ප්‍රදානය පිළිබඳව දැනුවත් නොකළ බව ප්‍රකාශ කරන ලදි.

මෙසේ මැතිවරණ කාලසීමාව තුළ පත්වීම් ලබා දීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2 (iv) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක කවින් හෙට්ටිආරච්චි මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara
.................................

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Company Secretary: Charuni Gunawardana
Directors: Anushika Amarasinghe, Shreen Saroor, Shyamala Gomez, T. Someswaran, Camena Guneratne, Tony Senewiratne, Pavithra Kailasapathy, Pulasthi Hewamanna

Address
Deputy General Manger
Ceylon Electricity Board
Uppuweli
Trincomalea
026-2222666

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) කාර්යාලය
පස්වැනි මහල,
ලංකා විදුලිබල මණ්ඩලය,
50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 00200.

දිනය: 2019 සැප්තැම්බර් මස 17 වැනිදා

මගේ අංකය: ඩීජීඑම්(පී)/එච්ආර්එම්(ආර්පීඩීඑම්)/ආර්පී4/පාරි.සම (බාහිර) 2019

[redacted]

ප්‍රිය මහත්මයාණෙනි,

<u>ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ධ පුහුණු අභ්‍යාසලාභී පාරිභෝගික සම්බන්ධීකාරක තනතුරට බඳවාගැනීම.</u>

ඉහත තනතුරට බඳවා ගැනීම සලකා බැලීම සඳහා 2019.09.18 දින පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල හා 2019.09.20 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත 2019.10.28 දින සිට ඔබ ලංකා විදුලිබල මණ්ඩලයේ **"අර්ධ පුහුණු අභ්‍යාසලාභී පාරිභෝගික සම්බන්ධීකාරක"** තනතුරට බඳවා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

පහත සඳහන් සේවා කොන්දේසි, මණ්ඩලීය නීතිරීති හා රෙගුලාසි මෙම පත්කිරීම හා අදාළ වේ.

01. <u>පුහුණුව, වේතනය හා සබැඳි කාරණා ;</u>

(අ) මෙම පත්වීමෙහි මුල් වසර ඔබ අර්ධ පුහුණු අභ්‍යාසලාභී පාරිභෝගික සම්බන්ධීකාරකවරයකු ලෙස පුහුණුවට යොදවනු ලැබේ. මෙම පුහුණුවෙන් එක් මසක් ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යාස මධ්‍යස්ථානයක පුහුණුව ලබා දෙනු ලැබේ. එක් අවුරුදු පුහුණුව නිම කිරීමෙන් පසු පවත්වන වෘත්තීය පරීක්ෂණයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් ඔබ අර්ධ පුහුණු පාරිභෝගික සම්බන්ධීකාරක තනතුරට පත්කරනු ලැබේ. අසමත් වුවහොත් තවත් එක් මසක පුහුණුවකට යොමු කරනු ලබන අතර, නැවත වෘත්තීය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට ඔබ යොමු කරවනු ලැබේ. එම දෙවන පරීක්ෂණයෙන් සමත් වුවහොත්, එම දෙවන පරීක්ෂණයෙන් සමත්වූ දින සිට ඔබ අර්ධ පුහුණු පාරිභෝගික සම්බන්ධීකාරක තනතුරට පත්කරනු ලබන අතර, එම දෙවන පරීක්ෂණයෙන්ද අසමත් වුවහොත්, ඔබගේ සේවය ලංකා විදුලිබල මණ්ඩලයට බැඳීමකින් හෝ වගකීමකින් තොරව අවසන් කරනු ලැබේ. අර්ධ පුහුණු පාරිභෝගික සම්බන්ධීකාරක තනතුරට පත්කිරීම අදාල අංශ භාර අතිරේක සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය මත සිදුකරනු ලැබේ.

(ආ) අර්ධ පුහුණු පාරිභෝගික සම්බන්ධීකාරක තනතුර ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර තනතුරකි. එනමුත් ඔබ ස්ථිරත්වය උපයාගත යුතුය. එම ස්ථිරත්වය ප්‍රදානය කිරීම හෝ නොකිරීම ඔබ සේවයට බැඳුණු දින සිට අවුරුදු තුනක පරිවාස කාලයක් තුල ඔබගේ වැඩ, හැසිරීම, පැමිණීම, ආකල්ප හා විනය පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ ඔබේ අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශ වලට යටත්ව සිදුකරනු ලබන අතර, ස්ථිරත්වය ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය සාමාන්‍යාධිකාරීවරයා සතුවේ.

(ඇ) ඔබගේ ඉදිරි උසස්වීම් හා තනතුරේ ස්ථිර කිරීමට අවශ්‍ය සේවා කාලය ගණනය කිරීමේදී පුහුණුවීම් කාලයෙන් එක් අවුරුද්දක් පමණක් සලකා බලනු ලබන අතර, එකී පුහුණු කාල සීමාව දීර්ඝ කරනු ලබන්නේ නම්, එම දීර්ඝ කරනු ලබන කාල සීමාව ඔබගේ ඉදිරි උසස්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

(ඈ) ඔබ අර්ධ පුහුණු අභ්‍යාසලාභී පාරිභෝගික සම්බන්ධීකාරකවරයකු ලෙස පුහුණුව ලබන කාලය තුලදී සේවයට වාර්තා කරන එක් දිනක් සඳහා ඔබට ගෙවනු ලබන දීමනාව, ලංකා විදුලිබල මණ්ඩලය තුල දැනට පවතින වැටුප් අර්බුදය විසඳුනු පසු දැනුම් දෙනු ලැබේ.

(ඉ) ඔබගේ මාසික දීමනාවෙන් / වැටුපෙන් 10% ක ප්‍රමාණයක් ඔබ මාසිකව මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, මණ්ඩලය විසින් මාසික දීමනාවෙන් / වැටුපෙන් 15% කට සමාන මුදලක් ඔබගේ අර්ථසාධක අරමුදලට මාසිකව බැර කරනු ලැබේ. ඔබගේ අර්ථසාධක අරමුදල් අංකය [redacted] වේ.

එමෙන්ම

(ඈ) ඔබ ලංකා විදුලිබල මණ්ඩලයේ දැනට බලපවත්නා වූ හා ඉදිරියට පැනවෙන්නාවූ විනය නීතිරීති හා අනෙකුත් සියළුම නීතිරීති හා රෙගුලාසි වලට යටත් වේ.

(ආ) එක් ලිත් මසකට කලින් සාමාන්‍යාධිකාරී වෙත කරනු ලබන ලිඛිත දැනුම් දීමකින් හෝ එම දැනුම්දීම වෙනුවට එක් මසක වැටුප් මණ්ඩලයට ගෙවීමෙන් හෝ ඔබට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් ඉල්ලා අස්විය හැකිය. එසේ ඔබ විසින්ම ඉල්ලා අස්වන්නේ නම්, හෝ නීත්‍යානුකූලව ඔබ සේවයෙන් ඉවත් කරනු ලබන්නේ නම් හෝ ඉන් පසුව ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රකාශයට පත් කරන්නා වූ හෝ අනීතයට බලපවත්වන්නා වූ ඉමානයම් හෝ දීමනාවන්ට, වරප්‍රසාදයන්ට හෝ පහසුකම් වලට හෝ ඔබ සුදුසුකම් නොලබයි.

(ඇ) නියි පරිදි ව්‍යවස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් මගින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත ඔබ සේවය සඳහා නුසුදුසු යැයි තීරණය කරනු ලැබුවහොත් හෝ සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත මණ්ඩලය මගින් විශ්‍රාම ගන්වනු ලැබුවහොත් හෝ මණ්ඩලීය රීති යටතේ විධිමත් විනයානුකූල දඬුවමක් වශයෙන් ඔබ මණ්ඩලීය සේවයෙන් පහකළ යුතුයැයි තීරණය කරනු ලැබුවහොත් හෝ ඔබ මෙම තනතුරට බඳවා ගැනීමට අදාලවන අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඔබගේ සේවය අවසන් කිරීමට මණ්ඩලයට හිමිකම් ඇත.

(ඈ) ඉහත 1 හි (ඇ) හි දක්වා ඇති පරිදි උතුරු නැගෙනහිර අනිවාර්ය සේවා කාලයෙන් පසු ඔබගේ රාජකාරී ස්ථානය මාරු කරනු ලැබිය හැකි අතර, සේවය සඳහා නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට ඔබ එකඟ විය යුතු වේ.

ඉහත සඳහන් කොන්දේසි හා විධිවිධානවලට යටත්ව මෙම පත්වීම භාරගැනීමට ඔබ කැමතිනම්, 2019-10-28 දින ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර) වෙත රාජකාරී වාර්තා කර, මෙම ලිපියෙහි අනුපිටපතෙහි නම් අත්සන යොදා මානව සම්පත් නිලධාරී (නැගෙනහිර) වෙත භාරදිය යුතුය.

ඉංජිනේරු ජේ.කේ.එස්.දසනායක
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්)

අ.කළේ : ඉංජිනේරු එස්.ඩී.ඩබ්.ගුණවර්ධන
සාමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

පිටපත්:
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර) : දැ.පි.
- නියෝජ්‍ය මුදල් කළමනාකරු (අර්ථසාධක අරමුදල) : දැ.පි.
- ගණකාධිකාරී (වියදම්) නැගෙනහිර : දැ.පි.
- අනුපිටපත : දැ.පි.

---

සාමාන්‍යාධිකාරී,
ලංකා විදුලිබල මණ්ඩලය,
කොළඹ .02

2019-10-17 දිනැති අංක ඩීජීඑම්(පි)/එච්ආර්එම්(ආර්පීඩීඑම්)/ආර්පී4/තාවි.සම් (බාහිර) 2019 දරණ ඔබගේ පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි හා විධිවිධාන වලට එකඟව මෙම පත්වීම භාරගනිමි. තවද එම සේවා ස්ථානයේ සේවය කිරීමට බැඳී සිටින බවද එම සේවා ස්ථානයේ සේවය භාරගැනීමට මා අකමැති වුවහොත් හෝ අපොහොසත් වුවහොත් මාගේ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු වන බවද මම දනිමි.

අත්සන :-

නම :-